# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 62 දරන
# සීගිරිය උරුමය පදනම පනත

---

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 13.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

# 1998 අංක 62 දරන සීගිරිය උරුමය පදනම පනත

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 28 වන දින]

එල්.ඩී.—ඕ. 82/96.

**සීගිරිය ලෝක උරුම භූමියේ සහ ඒ අවට පරිසරයේ සංස්කෘතික හා පුරා විද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා සීගිරිය උරුමය පදනම යන නමින් පදනමක් පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 62 දරන සීගිරිය උරුමය පදනම පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## සීගිරිය උරුමය පදනම පිහිටුවීම

2. (1) මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන, සීගිරිය උරුමය පදනම යන නාමයෙන් හැඳින්වෙන පදනමක් පිහිටුවනු ලැබිය යුතු ය. සීගිරිය උරුමය පදනම පිහිටුවීම.

(2) පදනම, (1) වන ඡේදයෙන් ඊට දී ඇති නාමයෙන්, අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, එම නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. පදනමේ අරමුණු පහත සඳහන් පරිදි වන්නේ ය:— පදනමේ අරමුණු.

(අ) සීගිරිය ලෝක උරුම භූමියේ සහ ඒ අවට පරිසරයේ සංස්කෘතික, පුරා විද්‍යාත්මක සහ ස්වාභාවික උරුමයේ සුරක්ෂණය, සංරක්ෂණය සහ සංවර්ධනය, ප්‍රවර්ධනය කිරීම ;

(ආ) සීගිරිය පිළිබඳව ශ්‍රී ලාංකික සහ විදේශීය ජනතාව අතර උනන්දුවක් ඇති කිරීම හා සීගිරිය ලෝක උරුම භූමිය සහ එහි පරිසරය සුරක්ෂිත කිරීම සහ සංරක්ෂණය කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ;

(ඇ) සීගිරිය ලෝක උරුම භූමියට සහ ඒ අවට පරිසරයට ප්‍රවේශ වීමට සහ එය අගය කිරීම සඳහා පහසුකම් සැලසීම ;

2—D 049786— 5,900 (98/08)

(ඈ) අධ්‍යාපනය, ඉඩපහසුකම් හා වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන්, සීගිරිය ලෝක උරුම භූමිය අවට ප්‍රදේශයේ පදිංචි ජනතාවගේ පොදු සුභසාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) යුනෙස්කෝ, අයිසීසීආර්ඕඑම්, අයිසීඕඑම්ඕඑස්, අයිසීඕඑම් සහ අයියුසීඑන් වැනි අන්තර්ජාතික වෘත්තීය සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් හා සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඊ) සීගිරිය ලෝක උරුම භූමිය සහ ඒ අවට පරිසරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම පිණිස, අධ්‍යයන පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ ඒවා, පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම ;

(උ) සීගිරිය ලෝක උරුම භූමියේ සහ ඒ අවට පරිසරයේ සංස්කෘතික, පුරා විද්‍යාත්මක හා ස්වාභාවික උරුමය අධ්‍යයනය කිරීමට පහසුකම් සැලසීම පිණිස අධ්‍යාපන ආයතන, කෞතුකාගාර, පර්යේෂණ මධ්‍යස්ථාන, පුස්තකාල සහ තොරතුරු සේවා සපයන ස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාම ;

(ඌ) සීගිරිය ලෝක උරුම භූමියේ විවිධ පැතිකඩ පිළිබඳ පර්යේෂණ භාර ගැනීම සහ ඒ සඳහා අරමුදල් සැපයීම හා එවැනි පර්යේෂණවල ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම ;

(එ) පදනමේ අරමුණු ප්‍රවර්ධනය කිරීම අරභයා ජර්නල, පොත්පත්, පත්‍රිකා සහ පුවත් ලිපි පළ කිරීම ;

(ඒ) පදනමේ ඉහත සඳහන් අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

පදනමේ බලතල.

4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, පදනමට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :—

(අ) මේ පනත යටතේ හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් පදනම වෙත සතුවන චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළවලට සම්බන්ධ යම් භාරයකට යටත්ව ඒවා විකිණීම, උගස්කිරීම, බදුදීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද අරමුදලට අයත් කිසිම නිශ්චල දේපළක්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව නොවිකිණිය යුතු ය ;

(ආ) පදනමෙහි අරමුණු ඉටුකර ගැනීම පිණිස අවශ්‍ය වියහැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම හා ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) පදනමේ දේපළට හෝ එහි යම් කොටසකට අමුත්තන් ඇතුළුකර ගැනීම සහ එම අමුත්තන් විසින් ඒ යම් දේපළක් ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පදනම විසින් වරින් වර මධ්‍යම සංස්කෘතික අරමුදල විමසා නිශ්චය කරනු ලබන ගාස්තු අය කිරීම ;

(ඈ) සීගිරිය ලෝක උරුම භූමියේ සහ ඒ අවට ප්‍රදේශයේ සංවර්ධනය සඳහා තැනැත්තන්ගෙන් හෝ සංවිධානවලින් මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලැබෙන ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග ලබා ගැනීම හෝ භාර ගැනීම ;

(ඉ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ, නාගරික සංවර්ධන අධිකාරියේ, පළාත් පාලන ආයතනවල සහ ලංකා සංචාරක මණ්ඩලයේ විධානවලට යටත්ව, සීගිරිය ලෝක උරුම භූමියේ සහ ඒ අවට ප්‍රදේශයේ ආගමික වන්දනාමාන ස්ථාන සහ ඉඳුම් හිටුම් සඳහා පහසුකම් හා පොදු පහසුකම් පිහිටුවීම, නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම ;

(ඊ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළහැකි සාධනපත්‍ර පිළියෙල කිරීම, ලිවීම, භාරගැනීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම හා නිකුත් කිරීම සහ යම් බැංකුවක හෝ බැංකුවල, ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කර පවත්වා ගෙන යාම ;

(උ) ස්වකීය අරමුණු ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය මුදල්, ඇප ඇතිව හෝ නොමැතිව, ණයට ගැනීම ;

(ඌ) ප්‍රයෝජනයට ගෙන නොමැති මුදල් ද ඇතුළුව පදනමට අයත් යම් මුදලක් (87 වන අධිකාරය වන) භාර ආඥාපනතේ 20 වන වගන්තිය හෝ වෙනත් යම් ලිඛිත

නීතියක හෝ විධිවිධාන යටතේ භාර අරමුදල් ආයෝජනය කිරීම නීත්‍යනුකූල වන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හෝ ඒ මුදල් ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිල දී ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ ඒ ආයෝජන වෙනස් කිරීම හෝ වහාම වියදම් කිරීමට අවශ්‍ය නොවන මුදල්වලින් යම් ප්‍රමාණයක් යම් බැංකුවක ස්ථිර තැන්පතු වශයෙන් තැන්පත් කිරීම ;

(ඵ) 6 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන කළමනාකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි බඳවා ගැනීමේ පරිපාටි මත, වෘත්තීය හා වෙනත් කාර්ය මණ්ඩල පත් කිරීම.

පදනමේ සංයුතිය.

5. පදනම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන—

(i) සංස්කෘතික කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් නම් කරනු ලබන වෙනත් යම් තැනැත්තෙක් ;

(ii) සංචාරක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් නම් කරනු ලබන වෙනත් යම් තැනැත්තෙක් ;

(iii) පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iv) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(v) පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(vi) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් නම් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තෙක් ;

(vii) මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පත් කර ඇති දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් නම් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තෙක් ;

(viii) මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් නම් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තෙක් ;

(ix) 9 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ප්‍රධාන පරිපාලන නිලධරයා.

(ආ) පහත සඳහන් අනෙකුත් සාමාජිකයන්, එනම්—

(i) මෙහි මින් මතු පත් කළ සාමාජිකයන් යනුවෙන් සඳහන් කරනු ලබන, පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ කීර්තිමත් තත්වයක් අත්කරගෙන සිටින තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ii) පුරා විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන් අතුරෙන් මෙහි (අ) ඡේදයේ සඳහන් නිලබලයෙන් පත් වූ සාමාජිකයන් විසින් තෝරා පත් කර ගන්නා, (මෙහි මින් මතු තෝරා පත් කළ සාමාජිකයන් යනුවෙන් හඳුන්වනු ලබන) සාමාජිකයන් දෙදෙනෙක් ;

(iii) පදනමේ අරමුදලට රුපියල් දශලක්ෂය බැගින් දායක වී තිබෙන සහ පදනමේ අරමුණු ඉදිරියට ගෙනයාමට භාරගෙන සිටින ආයතනික සාමාජිකයන් ; සහ

(iv) මේ පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව, තම සාමාජිකත්වය ලබාගෙන සිටින සාමාන්‍ය සාමාජිකයන් සහ යාවජීව සාමාජිකයන්.

(ඇ) මේ වගන්තියේ (ආ) ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේද යටතේ පත් කරන ලද යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙක් මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයෙන් විය යුතු ය.

පදනමේ පරිපාලනය.

6. (1) පදනමේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පදනමේ කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) පදනමේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මේ පනත මගින් පදනම වෙත පිරිනමන ලද හෝ පනවන ලද හෝ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම ද මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

(3) වාර්ෂික වැඩ සටහන, හා වැඩ සැලැස්ම ද වාර්ෂික අයවැය ලේඛනය ද තත් කාර්යය සඳහා සාදන ලද රීතිවලට අනුකූලව පිළියෙල කොට එම වැඩ සටහන, සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය අමාත්‍යවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම, මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

මණ්ඩලයේ සංයුතිය.

7. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) 5 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් පදනමේ නිලබලයෙන් පත් වූ සාමාජිකයන්,

(ආ) පහත සඳහන් වෙනත් සාමාජිකයන්, එනම්—

(i) 5 වන වගන්තියේ, (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් පදනමේ පත් කළ සාමාජිකයන් දෙදෙනා ;

(ii) 5 වන වගන්තියේ, (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් තෝරා පත් කළ සාමාජිකයන් දෙදෙනා ;

(iii) පදනමේ යාවජීව සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා එක් යාවජීව සාමාජිකයකුගෙන් ;

(iv) පදනමේ සාමාන්‍ය සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා එක් සාමාන්‍ය සාමාජිකයකුගෙන් ;

(v) පදනමේ නිල බලයෙන් පත් වූ සාමාජිකයන් විසින්, පදනමේ ආයතනික සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගන්නා ආයතනික සාමාජිකයන් අටදෙනකුගෙන්.

(2) යම් තැනැත්තෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වේ නම් හෝ පලාත් සභා මන්ත්‍රීවරයකු වේ නම් හෝ පලාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වුවහොත් හෝ ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙක් වන්නේ ය.

(3) මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා සහ රැස්වීම්වල කටයුතු කරගෙන යන ආකාරය සම්බන්ධයෙන් රීති සෑදීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(4) මණ්ඩලය විසින්, යටත් පිරිසෙයින්, වර්ෂයකට එහි රැස්වීම් දෙකක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(5) (අ) මණ්ඩලයේ සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකු, පිළිවෙලින් මණ්ඩලයේ සභාපතිවරයා, උප සභාපතිවරයා සහ ලේකම්වරයා ලෙස තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(ආ) මෙහි (අ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද, පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත් කරන ලද ප්‍රථම සභාපතිවරයා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලසීමාවක් ධුරය දරන්නේ ය.

(ඈ) රෝගාතුර වීම හෝ වෙනත් අශක්නුතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාට සිය ධුරයේ කටයුතු ඉටුකිරීම තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

(ඉ) (ආ) ඡේදය යටතේ පත් කරන ලද නිල බලයෙන් පත් වූ ප්‍රථම සභාපතිවරයා හැර, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා විසින් මණ්ඩලය අමතා යවන ලිපියක් මගින් පිළිවෙලින් තම තමන්ගේ ධුර වලින් ඉල්ලා අස්විය හැකි ය.

(ඊ) (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ ධුර කාලය, පිළිවෙලින් මණ්ඩලයේ ඔවුන්ගේ සාමාජිකත්ව කාලසීමාව වන්නේ ය.

(6) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) හෝ (iv) හෝ (v) වන අනුඡේද යටතේ තෝරා පත් කර ගන්නා මණ්ඩලයේ සාමාජිකයකු විසින් තත් කාර්යය සඳහා මණ්ඩලය අමතා යවන ලිපියක් මගින් ඉල්ලා අස්විය හැකි ය.

(7) 7 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන හෝ (iv) වන හෝ (v) වන අනුඡේද යටතේ තෝරා පත් කර ගන්නා මණ්ඩලයේ සාමාජිකයකු ඒ සාමාජිකයා තෝරා පත් කළ පුද්ගල මණ්ඩලය විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන හෝ (iv) වන හෝ (v) වන අනුඡේද යටතේ තෝරා පත් කර ගන්නා සාමාජිකයකුගේ ධුර කාලය, (6) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක් විය යුතු ය.

(9) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, (iii) වන හෝ (iv) වන හෝ (v) වන අනුඡේද යටතේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයකු මියගියහොත් හෝ ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, ඒ සාමාජිකයා තෝරා පත් කර ගත් පුද්ගල මණ්ඩලය විසින්, එසේ මියගිය, ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට, වෙනත් තැනැත්තකු සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගත හැකි ය.

(10) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන හෝ (iv) වන හෝ (v) වන අනුඡේද යටතේ තෝරා පත් කර ගන්නා ලද මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ වෙනත් අශක්තතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා තෝරා පත් කර ගත් පුද්ගල මණ්ඩලය විසින් ඒ සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු තෝරා පත් කර ගත හැකි ය.

(11) (9) වන හෝ (10) වන උපවගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයකු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මියයාමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් වුවහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(12) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, (ආ) ඡේදයේ (iii) වන හෝ (iv) වන හෝ (v) වන අනුඡේද යටතේ මණ්ඩලයට තෝරා පත් කර ගනු ලැබ, ධුරය හිස්කරනු ලැබුවා වූ සාමාජිකයකු, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

(13) මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයකු ම ඔහු සාමාජිකත්වය ලබා ඇත්තේ යම් තනතුරක් දැරීම ප්‍රකාරව ද ඒ තනතුර දරන තාක් කල් මණ්ඩලයේ සාමාජික ධුරය දැරිය යුතු ය.

(14) මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා හෝ තෝරා පත් කර ගැනීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්ම පමණක්, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත යයි සලකනු නොලැබිය යුතු ය.

(15) සභාපතිවරයා හෝ ඔහු නොමැතිවිට, උපසභාපතිවරයා හෝ මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ නොමැතිවිට එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(16) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වූ අවස්ථාවක, සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

8. පදනමේ මුද්‍රාව— පදනමේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි තැනැත්තකු භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ අවසරය ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ලේඛනයට අත්සන් තැබිය යුතු 9 වන වගන්තිය යටතේ පත් කරන ලද පරිපාලන නිලධරයා සහ මණ්ඩලයේ ප්‍රධාන සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය.

## II වන කොටස

### පදනමේ ප්‍රධාන පරිපාලන නිලධරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

පදනමේ ප්‍රධාන පරිපාලන නිලධරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම.

9. (1) මණ්ඩලය විසින් පදනමේ කාර්ය මණ්ඩලයට, පදනමේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු (මෙහි මින් මතු "පරිපාලන නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ පදනමේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු ප්‍රධාන පරිපාලන නිලධරයා වශයෙන් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද පරිපාලන නිලධාරි තනතුරෙහි පුරප්පාඩුවක් ඇතිවුවහොත් හෝ රෝගාතුරවීම, නිවාඩුපිට සිටීම හෝ වෙනත් අශක්තුතාවක් හේතුකොටගෙන පරිපාලන නිලධරයාට ඔහුගේ ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එම ධුරයේ කාර්ය කරගෙන යාම සඳහා සුදුසු යයි මණ්ඩලය සලකන යම් වැඩපිළිවෙලක් මණ්ඩලය විසින් යොදනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ විධානයට යටත්ව, පදනමේ කටයුතු පරිපාලනය සහ කාර්ය මණ්ඩලය පිළිබඳ පාලනය, පරිපාලන නිලධරයා වෙත පැවරෙන්නේ ය. මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමකට හෝ මණ්ඩලයේ යම් කමිටුවක රැස්වීමකට පැමිණ සිටීමට සහ ඒ රැස්වීමක් ඇමතීමට, පරිපාලන නිලධරයාට හිමිකම ඇත්තේ ය.

(5) පරිපාලන නිලධරයා—

(අ) ඔහුගේ කාර්ය ඉටුකිරීමට ස්ථිරව නොහැකි තත්වයට පත් වුවහොත් ; හෝ

(ආ) මණ්ඩලයේ මතය අනුව ප්‍රෝඩාකාරී හෝ නීතිවිරෝධී ස්වභාවයේ වූ නැතහොත් පදනමේ යහපතට හානිකර වූ යම් ක්‍රියාවක් හෝ දෙයක් ඔහු විසින් කර ඇත්නම් ; හෝ

(ඇ) මණ්ඩලයේ විධානවලට පටහැනිව ඔහු ක්‍රියාකර ඇත්නම්, මණ්ඩලය විසින් එකී පරිපාලන නිලධරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(6) පරිපාලන නිලධරයා මියගියහොත් හෝ (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ එම ධුරය දරන තැනැත්තා විසින් මණ්ඩලය අමතා තත් කාර්යය සඳහා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් පරිපාලන නිලධාරී ධුරය හිස් වන්නේ ය.

පදනමේ නිලධරයන් හා සේවකයන්.

10. (1) මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද රීතිවලට යටත්ව, පදනමේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) පදනමේ සියලු නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, මණ්ඩලය විසින්, රීති මගින් නියමිත බඳවා ගැනීමේ පටිපාටියට සහ පත්වීම් දීමේ කාර්ය පටිපාටියට අනුකූලව, කළ යුතු ය.

(3) මේ පනතේ සහ මේ පනත යටතේ සාදන ලද යම් රීතිවලට යටත්ව, පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ද ඇතුළුව ඔවුන්ගේ සේවා නියමයන් හා කොන්දේසි, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) සේවකයන් නෙරපීමේ බලතල ද ඇතුළුව, මණ්ඩලයේ විනය පාලනයට, පදනමේ නිලධරයන් හා සේවකයන්, යටත් විය යුතු ය. විනය කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලය විසින්, පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ යහපත සඳහා වන අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා ඒවා විධිමත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා පදනම වෙත කරන ලද සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**11.** යම් නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු පදනම විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් පදනම වෙත ඉටු කරනු ලබන යම් සේවා කාලයක්, එකී ගිවිසුම යටතේ ඔහුගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා, ආණ්ඩුව වෙත ඉටු කරන ලද සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

රජයේ නිලධරයන් පදනමේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**12.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන යම් ආයතනයක හෝ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සේවයේ නියුක්තව සිටින යම් නිලධරයකු, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත සහ නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, පදනමේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, පදනමේ කාර්ය මණ්ඩලයට, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා, තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) පදනමේ කාර්ය මණ්ඩලයට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) පදනමේ කාර්ය මණ්ඩලයට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(5) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, පදනමේ කාර්ය මණ්ඩලයට, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා එවැනිම කැමැත්ත ඇතිව, තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ "උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුම්වල, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ ඒ යෙදුම්වලට දී ඇති අර්ථයම ඇති අතර, "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

## III වන කොටස

## මුදල්

13. (1) පදනමට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ඊටම අයත් අරමුදලක් තිබිය යුතු ය. පදනමේ අරමුදල.

(2) පහත සඳහන් මුදල්, පදනමේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:—

(අ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී පදනම වෙත ලැබෙන සියලු මුදල් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත, කවර හෝ ප්‍රභවයකින්, ණය, පරිත්‍යාග, ත්‍යාග, හෝ ප්‍රදාන වශයෙන් පදනමට ලැබෙන සියලු මුදල් ;

(ඇ) සීගිරිය ලෝක උරුම භූමියේ වාර්ෂික නඩත්තු පිරිවැය පියවා ගැනීම සඳහා පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ඇ) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පදනමේ අරමුදලට මාරු කරනු ලැබිය හැකි, මෙහි පහත සඳහන් මුදල් වලින් සමන්විත වන සියලු මුදල්, එනම් :—

(i) සීගිරිය ලෝක උරුම භූමියට ඇතුළුවීම වෙනුවෙන් දේශීය සංචාරකයන්ගෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අයකර ගන්නා ගාස්තුවලින් ලැබෙන මුළු ආදායම ;

(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට ආරම්භ වන්නා වූ ද, එදින සිට ගණන් බලන ලද පස්වන අවුරුද්දේ අවසන් දිනයෙන් අවසාන වන්නා වූ ද, කාලසීමාව තුළ, සීගිරිය ලෝක උරුම භූමියට ඇතුළුවීම වෙනුවෙන් විදේශීය සංචාරකයන්ගෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අයකර ගන්නා ගාස්තුවලින් ලැබෙන ආදායමෙන් සියයට විසිපහක් ;

(iii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට, ගණන් බලන ලද හයවන අවුරුද්දේ පළමුවන දින ආරම්භවන්නා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට ගණන් බලන ලද දහවන අවුරුද්දේ අවසන් දිනයෙන් අවසාන වන්නා වූ ද, පස් අවුරුදු කාලසීමාව තුළ සීගිරිය ලෝක උරුම භූමියට ඇතුළුවීම වෙනුවෙන් විදේශීය සංචාරකයන්ගෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අයකර ගන්නා ගාස්තුවලින් ලැබෙන ආදායමෙන් සියයට තිස්පහක් ;

(iv) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට, ගණන් බලන ලද දහවන අවුරුද්ද අවසාන වීමෙන් පසුව කවර හෝ කාලසීමාවක් තුළ සීගිරිය ලෝක උරුම භූමියට ඇතුළුවීම වෙනුවෙන් විදේශීය සංචාරකයන්ගෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අයකර ගන්නා ගාස්තුවලින් ලැබෙන ආදායමෙන් සියයට පණහක්.

(3) පදනමේ අරමුදලින්, පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී පදනම විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ; සහ

(ආ) අරමුදලින් ගෙවිය යුතු යැයි මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ නියමිත සියලු මුදල්.

14. 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 6 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, සීගිරිය ලෝක උරුමය භූමියට පැමිණෙන දේශීය සංචාරකයන්ගෙන් හා විදේශීය සංචාරකයන්ගෙන් ගාස්තු අයකිරීමෙන් ලැබෙන ආදායම 13 වන වගන්තියේ, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත සංශෝධනය කිරීම.

15. (1) පදනමේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට, මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

නිසි ගිණුම් පොත් පත් පවත්වා ගැනීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු බව.

(2) පදනමේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතු ය.

(3) පදනමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

16. (1) පදනම විසින් ආනයනය කරන යම් භාණ්ඩ ආනයනය කිරීම පදනමේ අරමුණු වැඩිදියුණු කර ගැනීම අරභයා හිතකර ලෙස සැලකේ නම්, අමාත්‍යවරයා විසින්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව, එම භාණ්ඩ වෙනුවෙන් තීරු බදු ගෙවීමෙන් පදනම නිදහස් කළ හැකි ය.

අමාත්‍යවරයා විසින්, පදනම බදු ගෙවීමෙන් නිදහස් කළ හැකි බව.

(2) පදනම, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් අරමුදලට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන පරිත්‍යාගයක්, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයෙන් කරන ලද පරිත්‍යාගයක් ලෙස, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) විනෝද බදු ආඥාපනත යටතේ පනවන ලද යම් බද්දක් ගෙවීමෙන්, පදනම නිදහස් කරනු ලැබිය යුතු ය.

## IV කොටස

## පොදු විධිවිධාන

මණ්ඩලයට අදාළව අමාත්‍යවරයා සතු බලතල..

**17.** පදනමේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද කාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් මණ්ඩලයට කලින් කල යම් පොදු හෝ විශේෂ විධාන, ලියවිල්ලක් මගින් දෙනු ලැබිය හැකි ය.

රජයට අයත් චංචල සහ නිශ්චල දේපළ පදනමෙහි ප්‍රයෝජනය සඳහා ලබාදිය යුතු බව.

**18.** (1) පදනමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයට අයත්, යම් චංචල හෝ නිශ්චල දේපළක්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් පදනමට පවරා දෙනු ලැබිය හැකි අතර, එසේ පවරා දෙනු ලබන යම් දේපළක්, එකී නියමයේ දින පටන්, පදනමට පැවරී, පදනමේ දේපළ බවට පත් වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින්, තත් කාලයෙහි රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, කවර හෝ රජයේ ඉඩමක්, පදනමේ යම් කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස, පදනමට ලබාදිය හැකි ය : නැතහොත් පවරා දෙනු ලැබිය හැකි ය.

(3) රජයට අයත් යම් චංචල දේපළක්, පදනමේ කාර්ය සඳහා අවශ්‍ය වූ විට, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, එම චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය, පදනම වෙත පවරා සතුකර දෙනු ලැබිය හැකි ය :

එසේ වුවද මේ වගන්තියේ මීට පූර්වයෙන් ඇති විධිවිධාන යටතේ, රජයට අයත් යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසි නියමයක්, ඒ දේපළ පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ වාර්තාව පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ යුතු බව.

**19.** එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලසීමාවක් ඇතුළත, ඒ ඒ වර්ෂය තුළ පදනමේ කටයුතුවල සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක් මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව, අදාළවන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර, අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ යුතු ය.

20. පදනම, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව අර්ථකථනය කළ යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

21. මණ්ඩලයේ සියලු සාමාජිකයන් හා පදනමේ නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් හා පදනමේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

22. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ පදනමේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට අදහස් කෙරෙන කවර හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ සාමාජිකයාට හෝ නිලධරයාට හෝ සේවකයාට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ කරන ක්‍රියා සඳහා ආරක්ෂාව.

(2) පදනම විසින් හෝ පදනමට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩු කටයුත්තක දී පදනම විසින් දරන ලද යම් වියදමක්, පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩු කටයුත්තක දී පදනම වෙත ගෙවන ලද හෝ පදනම විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු පදනමේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලද බව අදහස් කෙරෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, කවර හෝ අධිකරණයක් ඉදිරිපිට ඒ තැනැත්තාට එරෙහිව පවරා ඇති යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩු කටයුත්තේ දී ඒ තැනැත්තා විසින් අයකර ගනු ලැබුවහොත් මිස, එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් බවට අධිකරණය තීරණය කළහොත්, පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රීති.

**23.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මෙහි පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය:—

(අ) පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික ද ඇතුළුව, ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි ;

(ආ) පදනමේ නිලධරයන් හා සේවකයන් බඳවා ගැනීමේ පරිපාටි සහ පත්කිරීම පිළිබඳ කාර්ය පරිපාටි ;

(ඇ) පදනමේ වාර්ෂික වැඩසටහන් සහ වැඩ සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය, වාර්ෂික වාර්තාව සහ ගිණුම් සහ එම වැඩසටහන හා වැඩ සැලැස්ම, අයවැය ලේඛන වාර්තාව හා ගිණුම් පිළියෙල කළ යුතු ආකාරය ;

(ඈ) පදනමේ සාමාන්‍ය හා යාවජීව සාමාජිකයන් බඳවා ගතයුතු ආකාරය ;

(ඉ) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ මේ පනත යටතේ රීති සෑදීමට බලය දී ඇත්තේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කරුණු.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**25.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ —

"මධ්‍යම සංස්කෘතික අරමුදල" යන්නෙන්, 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මගින් පිහිටුවනු ලැබූ මධ්‍යම සංස්කෘතික අරමුදල අදහස් වේ ;

"ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙන්, 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ ;

අයිසීසීආර්ඕඑම්" යන්නෙන්, සංස්කෘතික දේපළ සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය පිළිබඳ අධ්‍යයනය සඳහා රෝමයේ පිහිටුවා ඇති ජාත්‍යන්තර මධ්‍යස්ථානය අදහස් වේ :

"අයිසීඕඑම්ඕඑස්" යන්නෙන්, ස්මාරක හා පුරාවිද්‍යා භූමි පිළිබඳ ජාත්‍යන්තර කවුන්සලය අදහස් වේ ;

"අයිසීඕඑම්" යන්නෙන්, ජාත්‍යන්තර කෞතුකාගාර කවුන්සිලය අදහස් වේ ;

"ආයතනික සාමාජික" යන්නෙන්, පදනමේ අරමුදලට එක්වර ගෙවීමක් වශයෙන් රුපියල් දශලක්ෂයකින් දායක වී ඇති තැනැත්තෙක් හෝ ආයතනයක් අදහස් වේ ;

"අයියූසීඑන්" යන්නෙන්, ස්වභාව සම්පත් සංරක්ෂණය සඳහා වන ජාත්‍යන්තර සංගමය අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින්, ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ ඒ යටතේ ඇතිකොට හෝ පිහිටුවන ලද යම් අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදයෙන් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"සීගිරිය ලෝක උරුම භූමිය" යන්නෙන්, පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ අංක 10370 හා 1952.03.21 දින දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය සහ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරන ලදුව අංක 542/10 හා 1989.01.27 දින දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය අදහස් වේ ;

"යුනෙස්කෝ" යන්නෙන්, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය අදහස් වේ.

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.